# ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය සහ ශ්‍රීමත් අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන්ගේ භාවිතය

**අනිල් කුමාරසිරි**
අධිකාරී දකුණු පළාත
ශ්‍රීමත් අනගාරික ධර්මපාල අනුස්මරණ අධ්‍යයන කේන්ද්‍රය
*kumarsirianil@gmail.com*

යටත් විජිත සමාජයන්හි දේශපාලන සංවර්ධනය හැදෑරීමේ දී සමාජ ව්‍යාපාරවලට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. සමාජ ව්‍යාපාර යනු කිසියම් සමාජීය කණ්ඩායමක් සඳහා යොමු වූ අරමුණක් මූලික කරගෙන ක්‍රියාත්මක වන සාමූහික සමාජ ක්‍රියාකාරිකයෙකි. දේශපාලන පක්ෂ බිහිවීමට පෙර යටත් විජිතවල දේශපාලනය ක්‍රියාත්මක වූයේ සමාජ ව්‍යාපාර මගිනි. ජාතික ව්‍යාපාර මෙම සමාජ ව්‍යාපාර අතුරින් ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගනියි. ඒවා නූතන යුගයේ පැන නැඟීමකි. ජාතික රාජ්‍ය බවට යටත් විජිත ප්‍රදේශ පත්කර ගැනීමට පදනම වැටෙන්නේ ජාතික ව්‍යාපාරවල සංවර්ධනය නිසා ය. නිදහස, ස්වයංපාලනය, වගකීමේ ආණ්ඩුව යන තේමා එකක් හෝ කිහිපයක් මුල්කරගෙන ක්‍රියාත්මක වීම ජාතික ව්‍යාපාරයන්ගේ මූලික ලක්ෂණය යි.

ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාර ස්වභාවය වැඩවසම් සමාජ සම්බන්ධතා බිඳ දමා නව ධනේෂ්වර සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහාත්, සේවා සහ නිෂ්පාදන මාදිලියේ නව සම්බන්ධතා සැකැස්මක් බිහිකිරීම සඳහාත් ගොඩ නඟන ප්‍රජාතාන්ත්‍රවාදී විප්ලවයකි. ලංකාවේ යටත් විජිත නිෂ්පාදන සම්බන්ධතාවලින් හා යටත් විජිත පීඩනයන්ගෙන් නිදහස් වීම සඳහා කරනු ලබන අරගල ද මෙනමින් හැඳින්වුවත් ධර්මපාලතුමා අරඹන ලද ව්‍යාපාරය සැබැවින් ම යටත් විජිත විරෝධී ජාතික විමුක්ති ව්‍යාපාරයකි.

ධර්මපාලතුමාගේ මෙකී ව්‍යාපාරයට එරෙහිවූවෝ යටත් විජිතවාදීන් වීම මෙම අර්ථය සනාථ කරයි. එනිසා මෙතුමා ප්‍රධාන වශයෙන් යටත්විජිත වියගසින් නිදහස් වීම සඳහා වන උපාය මාර්ගික සැලැස්ම සිය භූමියට ඉදිරිපත් කරන්නට යෙදුණි. එතුමා අරඹන ලද නව ආර්ථික දැක්මක් ද සංස්කෘතික මගපෙන්වීම ද සමාජීය පෙළගැස්ම හා අරගලය ද මේ වටා ගොඩනැගුණි. මත්පැන් උවදුරට විරුද්ධ වීම ද ජාතික සිරිත් විරිත් හා ඇඳුම් පැලඳුම් ද, නව කර්මාන්ත හා වෙළඳාම මුල්කොට සිය භාවිතය මෙම බිම මත ධර්මපාලතුමා විසින් මුදා හරින ලදි.

ආගමික මඟ පෙන්වීමකට වඩා මෙතුමා වග වූයේ, මේ අසහාය සත්කාරය සුජාත භූමියේ උරුමක්කාරයින් හා ඓතිහාසික උරුමකරුවන් හා ජන සංයුතියේ විශාල පංගුව සිංහල බෞද්ධ වීම නිසාම ඔහුගේ ආමන්ත්‍රණය සිංහල බෞද්ධයන්ට විය. සෙසු ජාතිකත්වවල

පැවැත්ම හා මහ ජාතිය සමඟ සහයෝගයෙන් ජීවත් වීම ඔහු හැම විට ම ඉගැන්වීමට ගත්තේ ය. බැලූ බැල්මට එය සිංහල බෞද්ධ ඇමතීමක් සේ පෙනුණ ද එය පුළුල් ජාතික ඇමතීමක්ම විය. මේ නිසා ඔහු ලද හිරිහැර අපමණ ය. නැඟී එන කාහල නාදයට බියපත් වූ විජිතවාදීන් එතුමා භූමියෙන් පිටුවහල් කිරීමට සමත් වුව ද, 1915 මුස්ලිම් ජාතිවාදී කෝලාහලයට එතුමාගේ සබඳකමක් නැත. අවාසනාවට සුජාත භූමියෙන් පිටමන් කිරීම නිසා ලෝකවාසීන්ගේ බෞද්ධ උරුමය වූ බුද්ධගයාව බේරාගැනීමේ සීමාන්තික සටනකට කොටු කරන ලදි.

නව ජාතික රාජ්‍යයක් සඳහා වූ එතුමාගේ මැදිහත් වීම එතැනින් අහිමි විය. එම නිසාම යටත්විජිත අර්ථක්‍රමය හා දේශපාලන සංස්කෘතික වටපිටාව තවමත් අපව වෙලාගෙන ඇත. මේ වටපිටාවෙන් නිදහස් වීම සඳහා ධර්මපාලතුමාගෙන් අත්හැරුණු ජාතික විමුක්ති අරගලයේ භූමිකාව නූතන අභියෝග හා වටපිටාව මැද ජයග්‍රහණය කරා යෑමට නම් අමතර කියවීමක් අවශ්‍යව තිබේ. ධර්මපාලතුමා නිවැරදිව කියවාගැනීමත් එම උත්කෘෂ්ඨ අරමුණු කරා එතුමාට ළඟා වීමට නොහැකි වූ සත්‍ය වටපිටාව, නූතන අභියෝගයත් නිවැරදිව පෙළගස්වා ගැනීම නූතන ධර්මපාලවරුන්ගේ වගකීමයි. අපි ඉමහත් ධෛර්යයෙන් යුක්තව ඒ දෙසට පිය නගමු.